**සීමාසහිත ලංකා සළුසල සමාගම - 2008/2009**
**-----------------------------------------------------**

**සීමාසහිත ලංකා සළුසල සමාගමේ 2009 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2009 මාර්තු 31 දිනෙන් අවසන් 2008/2009 මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-------------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**
**----------------------**

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.**

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**
**-------------------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස 2009 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනයේ , ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුනේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.**

**2. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**2.1 මතය ව්‍යාවනය**
**------------------**

**මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------------**

**2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම**
**-------------------------------**

**සීමාසහිත ලංකා සළුසල සමාගම අඛණ්ඩ පැවැත්මක් ඇතැයි යන උපකල්පනය මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණද, 1992/1993 ගිණුම් වර්ෂයේ සිට ආයතනය පාඩු ලබමින් පැවතුණි. 2009 මාර්තු 31 දිනට සමුච්චිත පාඩුව රු.767,878,682 ක් වූ අතර සමාගමේ කොටස් අයිතියේ පිරිහීම රු.467,878,682 ක් විය. තවද ආයතනය විසින් රු.7,000,000 ක් ආයෝජනය කළ සමාගමක අයිතිය සියයට සියයක් හිමිව තිබූ සීමාසහිත ලංකා ටෙක්ස්ටයිල් ඇන්ඩ් එම්පෝරියම් සමාගම අක්‍රීය තත්වයේ පැවතීම හේතුවෙන් එම ආයෝජිත මුදල හා එම සමාගමෙන් තව දුරටත් ලැබිය යුතු රු.70,134,234 ක මුදලත් ලැබීම අවිනිශ්චිතව පැවතුණි. ඉහත බලපෑම් හේතුවෙන් හිමිකාරීත්වය හීනවී යාම නිසා භාණ්ඩාගාරයේ හෝ රජයේ හෝ වෙනත් මූල්‍ය සහයක් හෝ නොමැතිව සමාගම පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.**

**2.2.2** ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 මාර්තු 31 දිනට රු.17,892,200 ක් ලෙස ගිණුම්වල දක්වා ඇති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ තොගයට රත්නපුර ශාඛාවේ පැවති භාණ්ඩ තොගයේ වටිනාකම තක්සේරු කර ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2008 ජනවාරි මාසයේ නිළ ඇඳුම් ප්‍රවාහනය වෙනුවෙන් දරන ලද ඉකුත් වර්ෂයට අදාළ රු. 101,570 ක වියදම සමාලෝචිත ගිණුම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රධාන කාර්යාලය වෙනුවෙන් ගෙවිය යුතු රු.147,006 ක විදුලි ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත ගිණුම් වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ගිණුම් වල වෙන් කිරීම් සිදුකර නොතිබූ අතර 2008 අප්‍රේල් 01 දිනට පැවති රු. 1,461,650 ක් වූ හිඟ විගණන ගාස්තු නිරවුල් කරද නොතිබුණි.

(ඉ) උසාවි නියෝගයක් මත සමාලෝචිත ගිණුම් වර්ෂය තුල ණය හිමියන් වෙත ගෙවන ලද රු.1,225,000 ක් වූ මුදල නීති වියදම් ලෙස ලාභයට එරෙහිව කපාහැර තිබීම නිසා ණය හිමි ගිණුම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ස්ථාවර වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය රු.972,964 ක් වැඩියෙන් වෙන් කර තිබුණි.

**2.2.3** නොසැසඳූ පාලන ගිණුම්

---

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු ගිණුම් 7ක අයිරා ශේෂයන් හා බැංකු සනාථ කිරීම් අනුව ශේෂයන් අතර රු.25,699,136 ක වෙනසක් පැවති අතර බැංකු ගිණුම් 02ක තැන්පතු ශේෂයන් හා බැංකු සනාථ කිරීම් අනුව ශේෂයන් අතර රු.23,514,284 ක වෙනසක් පැවතුණි.

**2.2.4** විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

---

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට හෝ සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ඉතිරි තොග | 17,892,200 | තොග සමීක්ෂණ වාර්තා |
| (ආ) | සමුච්චිත ක්ෂය වෙන් කිරීම | 47,775,818 | ක්ෂය ගණනය කළ ආකාරය දැක්වෙන විස්තරාත්මක උප ලේඛන |
| (ඇ) | ආයෝජන | 7,000,000 | ලංකා ටෙක්ස්ටයිල් ඇන්ඩ් එම්පෝරියම් සමාගමේ කරන ලද ආයෝජන සඳහා ආයෝජන සහතික |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙළඳ හා වෙනත් ණය ගැතියන් | 24,053,369 | ණය ගැති ශේෂ තහවුරු කිරිම්, කාල විශ්ලේෂණය |
| (ඉ) | බොල් සහ අඩමාන ණය වෙන්කිරිම | 12,078,552 | බොල් සහ අඩමාන ණය වෙන්කිරිමේ පදනම |
| (ඊ) | අත්තිකාරම් හා කලින් ගෙවීම් | 11,573,597 | උපලේඛන හා සනාථ කිරීම් |
| (උ) | සේවක ණය | 1,418,459 | ණය ලේඛණය, ණය සඳහා කාල විශ්ලේෂණ |
| (ඌ) | ලැබිය යුතු බදු | 4,558,719 | උපලේඛන හා සනාථ කිරීම් |
| (එ) | සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු දෑ | 70,134,234 | උපලේඛන හා සනාථ කිරීම් |
| (ඒ) | කෙටි කාලීන තැන්පතු | 23,859,572 | ස්වෙච්චාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයකට අදාළව කරන ලද තැන්පතු සඳහා සනාථ කිරීම්. |
| (ඔ) | මුදල් හා බැංකු තැන්පතු | 23,143,282 | උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |
| (ඕ) | වෙළඳ හා වෙනත් ණයහිමියන් | 352,817,722 | උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |
| (ක) | බැංකු අයිරා ශේෂ | 141,331,540 | ගිණුම් 02 කට අදාළ ශේෂ සනාථ කිරිම් |
| (ග) | නිෂ්කාශන හා ප්‍රවාහන වියදම් | 900,000 | ගෙවීම් වවුචර් - 03 |
| (ජ) | ජල විදුලිය හා දුරකථන බිල්පත් | 2,451,052 | ගෙවීම් වවුචර් ,අදාල බිල්පත් |
| (ට) | පාසැල් නිල ඇඳුම් ව්‍යාපෘතිය<br>ආදායම -<br>වියදම - | <br>312,607<br>2,607,138 | ව්‍යාපෘතියට අදාළ ආදායම් හා වියදම් තොරතුරු |
| (ඩ) | ස්ථාවර වත්කම් | 24,594,955 | සමීක්ෂණ වාර්තා,හිමිකම් ඔප්පු,බදු ගිවිසුම් |
| (ණ) | අනෙකුත් ණය ගැතියන් | 6,938,495 | ණය ගැති ශේෂ තහවුරු කිරිම්, කාල විශ්ලේෂණය |
| (ත) | අනෙකුත් ආදායම් | 20,305,232 | උප ලේඛණ හා ශේෂ සනාථ කිරිම |
| (ද) | මූල්‍ය කල්බදු | 1,724,622 | ශේෂ සනාථ කිරීම් |
| (න) | බැංකු ණය | 21,439,935 | ශේෂ සනාථ කිරීම් |

**2.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ශුද්ධ රු.24,053,370 ක් වූ මුළු ණයගැතියන්ගෙන් සියයට 50.22 ක් වූ රු.12,078,552 ක මුදලක් 2005/2006 ගිණුම් වර්ෂයේ සිට අඩමාන ණය ලෙස වෙන් කර තිබුණි.

(ආ) 2004 වර්ෂයේ සිට ඉදිරියට පැවත එමින් පැවති එකතුව රු. 2,084,410 ක් වූ ණයගැති ශේෂ 11 ක් 2009 මාර්තු 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට රු.19,469,999 ක් වූ අනෙකුත් ණයගැතියන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය නමින් හා සුභ සාධන ණයගැතියන් ලෙස පිළිවෙලින් රු.8,045,387 ක් හා රු.4,510,876 ක් වූ බැර ශේෂයන් අඩුකර දක්වා තිබුණද එම බැර ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල හා සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් දීර්ඝ කාලයක සිට ගෙවිය යුතු එකතුව රු.39,829,636 ක ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව ගිණුම් වල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත ගිණුම් වර්ෂයේ අවසානයට පැවති රු.430,039 ක් වූ ගෙවිය යුතු දුරකථන ගාස්තු ශේෂය තුල දීර්ඝ කාලයක සිට පැවත එන රු.294,107 ක ශේෂයක් පැවතුණි.

(ඊ) විවිධ බදුවර්ග වලට අදාලව ගිණුම් වල ඉදිරියට ගෙනවිත් තිබූ රු. 5,389,872 ක හර ශේෂය හා රු. 15,418,457 ක බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ගෙවිය යුතු බැංකු අයිරා පොලිය රු. 157,497,600 ක් දීර්ඝ කාලයක සිට ගිණුම් වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

**2.4** නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 395 | බැංකු ජංගම ගිණුම් 10 කට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ 2008/2009 ගිණුම් කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 396 (ඇ) | බැංකු ජංගම ගිණුමකට අදාලව නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ රු.4,110,231 ක් වටිනා චෙක්පත් 62 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
--------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත ගිණුම් වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.72,829,342 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,402,986 ක් වූයෙන් ඉකුත් ගිණුම් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.55,426,356 ක පිරිහීමක් විය. පසුගිය ගිණුම් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත ගිණුම් වර්ෂයේ ආදායම රු.30,110,167 කින් අඩුවීම හා බෙදාහැරීමේ වියදම් හා පරිපාලන වියදම් රු.14,931,224 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත ගිණුම් වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2006/2007 ගිණුම් වර්ෂයේ හැර අනෙකුත් වර්ෂවලදී ආයතනයේ මූල්‍ය ඌනතාවයක් පෙන්නුම් කෙරුණි. 2006/2007 ගිණුම් කාලපරිච්ඡේදයේ අතිරික්තයට දේපල පිරියත උපකරණ රු.194,340,862 කට විකිණීමෙන් ලද ලාභය සහ ගෙවිය යුතු පොළී වියදම රු. 62,583,288 කින් කපා හැරීම හේතුවී තිබුණි.

රාජ්‍ය බදු වලට අදාළ වන වාර්ෂික වියදම අදාළ වියදම් ගිණුම්වල සටහන් කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් හා වත්කම් ක්ෂය කිරීම් ගිණුම් ගත කිරීමේ දෝෂ හේතුවෙන් එම ගිණුම්වල නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි විය.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි
--------------------------------------------------------------------------------

2016 මාර්තු 31 දිනවන විට සමාගමට එරෙහිව විභාග වෙමින් පැවති නඩු 25 ක් සඳහා රු.141,455,374 ක මුදලක් සමාගම විසින් බාහිර පාර්ශවයන්ට ගෙවිය යුතුව තිබූ අතර, සමාගම විසින් පවරන ලද නඩුවක් සඳහා රු. 241,189 අය විය යුතුව තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
-------------------------

4.1 කාර්යසාධනය
---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගුණාත්මක රෙදිපිළි සහ ඇඳුම් විකිණීම අරමුණු කර ගනිමින් සළුසල ආයතනය 1967 වර්ෂයේදී කොළඹ නගරය තුල එක් ප්‍රදර්ශනාගාරයක් සහිතව ව්‍යාපාර කටයුතු ආරම්භ කර තිබුණි. 1971 වසරේදී 1970 අංක 23 දරන රාජ්‍ය වෙළඳ සංස්ථා පනත යටතේ සංස්ථාවක් ලෙස පරිවර්තනය කර තිබුණු අතර 1991 වසරේදී එය සීමාසහිත සමාගමක් ලෙස ස්ථාපිත කර තිබුණි. විවෘත ආර්ථිකය තුල තරඟකාරීව කටයුතු කිරීමට නොහැකිවීම හේතුවෙන් ආයතනය දිගින් දිගටම පාඩු ලබා තිබූ අතර, 2006 දෙසැම්බර් මාසයේදී සීමාසහිත සළුසල සමාගම ඇවර කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. 2009 මැයි 15 දිනැති අංක 1601/34 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සීමාසහිත ලංකා සළුසල සමාගම උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයට (SEMA) පවරා තිබුණි.

(ආ) උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය ඉදිරිපත් කර තිබුණු යෝජනාවන් අනුව 2009 අගෝස්තු 27 දිනැතිව PED/CAB/ID/2009 අමාත්‍ය මණ්ඩලය ගෙන තිබුණු තීරණය පරිදි සීමාසහිත ලංකා සළුසල සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා "ලංකා සළුසල" නාමය "ලක් සළුසල" ලෙස නෛතිකව සංස්ථාගත කිරීම සඳහා අවශ්‍ය ලේඛන සකස් කර මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර සීමාසහිත ලංකා සළුසල සමාගම ඈවර කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවද ලංකා සළුසල සමාගම ප්‍රධාන කාර්යාලයට අමතරව ශාඛා 19 ක් ප්‍රතිව්‍යුහගත කරන අවස්ථාව වන විට ව්‍යාප්තව තිබුණි. මේ අතරම ආයතනයේ සේවකයින් 274 දෙනෙකු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක PED10 දරන චක්‍රලේඛය

පදනම් කරගෙන ස්වේඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමයක් හඳුන්වාදීම හා ඒ සඳහා කොල්ලුපිටිය, රත්මලාන හා උණවටුන පිහිටි දේපල විකුණා අරමුදල් ලබාගැනීම සඳහාත් , ශ්‍රී ලංකා රේගුවෙන් හා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් රාජසන්තක කරනු ලබන රෙදිපිළි හා ඒ ආශ්‍රිත භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට පෙර ඒවා විකිණීමේ පළමු අයිතිය ලක්සළුසලට ලබා දීමටත් අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි.

(ඇ) සීමාසහිත ලංකා සළුසල සමාගම ප්‍රතිව්‍යුහගතකරණය කිරීම යන මැයෙන් අමාත්‍යවරයා විසින් 2013 අගෝස්තු 02 දින ඉදිරිපත් කර තිබුණු අංක 13/0878/553/010 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව අමාත්‍ය මණ්ඩලය විසින් 2013 අගෝස්තු 15 දින සීමාසහිත ලංකා සළුසල සමාගම සතු දේපල රාජ්‍ය ආයතන වෙත පවරා එම මුදල් සීමාසහිත ලංකා සළුසල ආයතනයට ලබා ගැනීමටත් , මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ මත පදනම්ව සීමාසහිත ලංකා සළුසල ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම පිණිස සවිස්තරාත්මක ව්‍යාපාර සැලැස්මක් ක්‍රියාත්මක කොට අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමටත් උපදෙස් ලබා දී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සේවකයින් අනිවාර්ය නිවාඩු ගැන්වීම් හා නවක සේවකයින් බඳවා ගැනීම

--------------------------------------------------------------------------------------

(i) අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව 2009 මැයි 15 දිනැති පේෂකර්මාන්ත අමාත්‍යංශ ලේකම්ගේ අංක MT1/D/3/1/2009 දරන ලිපිය ප්‍රකාරව සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සේවය කළ නිලධාරීන් 54 දෙනෙකු හැර ශාඛාවල සේවය කළ සේවකයින් ඇතුළුව 158 දෙනෙකු වැටුප් සහිතව 2009 මැයි 15 දින සිට අනිවාර්ය නිවාඩු ගන්වා තිබුණි. එකී සේවකයන් වෙනුවෙන් එදින සිට 2016 ජූනි 30 දින දක්වා රු. 71,810,624 ක මුදලක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. සේවකයින් අනිවාර්ය නිවාඩු ගැන්වීම නිසා පිටපළාත්වල පිහිටි ශාඛා 11 ක් වසා දැමීමට කටයුතු කර තිබුණි.

(ii) වැටුප් සහිතව ඉහත නිලධාරීන් අනිවාර්ය නිවාඩු යැවීමෙන් පසුව සමාගමේ කාර්ය මණඩලයට තාවකාලික පදනමින් සේවකයින් 84 දෙනෙකු 2009 මැයි 15 දිනෙන් පසුව වරින් වර බඳවා ගෙන තිබුණු අතර 2016 අප්‍රේල් 30 දින දක්වා රු. 18,498,760 ක මුදලක් වැටුප් හා වේතන වෙනුවෙන් වැයකර තිබුණි. නැවත සේවකයින් බඳවා ගැනීමට අදාල අනුමැතිය ලබා දුන් ලිපි ලේඛණ විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ආ) ජාවත්ත අලෙවි ප්‍රදර්ශනාගාරයේ 2015 මාර්තු 16 දිනට තොග ගණනයේ දී රු. 163,168 ක තොග ඌනතාවයක් පැවති අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2010 සිට 2015 වර්ෂය දක්වා වර්ෂ 6 ක කාල පරිච්ඡේදය තුලදී රෙදිපිළි අලෙවියෙන් උපයන ලද රු. 21,204,695 ක් වූ ආදායමින් රු. 2,577,567 ක වට්ටම් මුදලක් නිශ්චිත වට්ටම් ප්‍රතිශතයක් නිර්ණය කිරීමකින් හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සභාපතිගේ හෝ වැඩබලන සාමාන්‍යාධිකාරීගේ අභිමතය පරිදි ගැනුම්කරුවන් වෙත ලබා දී තිබුණි.

(ඇ) සමාගමේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ජාවත්තේ පිහිටි ඉඩම 2005 ජනවාරි 01 දින සිට වසර 30 ක කාලයක් සඳහා තක්සේරු වටිනාකම මත බදු ගැනීමට ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ප.ඉ.කො/06/කො/175 ලිපියෙන් දැනුම් දී තිබුණද විගණිත

දිනය වූ **2016** අප්‍රේල් **30** වන විටත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර බදු පදනම මත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීමේ අරමුණින් යෝජිත ප්‍රතිව්‍යුහකරණය යටතේ බඳවා ගැනීම් පරිපාටිය සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි.

**4.3** ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ආ) බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත දහම් පාසල් ගුරුවරුන් සඳහා සාරි බෙදාදීම වෙනුවෙන් සාරි මිලදී ගැනීමේ ඇනවුම අනුව **2014** වර්ෂයේදී සාරි **40,000** ක් එකක් රු.**1,400** බැගින් රු. මිලියන **56** කට මිලදීගෙන තිබුණි. මෙම සාරි තොගය බුද්ධශාසන අමාත්‍යාංශය විසින් ලබාදී ඇති පිරිවිතර වලට අනුකූල වන්නේද යන්න ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයෙන් පරීක්ෂා කරගෙන තිබූ අතර එහිදී පිරිවිතර වලින් බැහැර වීම නිරීක්ෂණය විය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **2.14.1** අනුව රු. මිලියන **25** ට වැඩි භාණ්ඩ හා සේවා සඳහා අදාල මිලදී ගැනීම් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මගින් ක්‍රියාත්මක කළ යුතු වුවත් ආයතනයේ මිලදී ගැනීම් කමිටුව විසින් මෙම කටයුතු සිදු කර තිබුණු අතර ප්‍රසම්පාදන මූලධර්ම වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) **2010** වර්ෂයේ සිට **2015** වර්ෂය දක්වා රු.**548,819,679** ක් වූ රෙදිපිළි මිලදී ගැනීමේදී **2006** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අරමුණු අංක **1.2** , ප්‍රසම්පාදන ආචාර ධර්ම අංක **1.4.1, 1.4.2** හා **1.4.3** වගන්ති වලට පටහැනිව සමාගමේ සම්බන්ධිත පාර්ශව සමඟ අදාල ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි.

**4.4** වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සමාගමේ සම්පත්

---

**2003** ජුනි **02** දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **9.4** වගන්තියට පටහැනිව සළුසල සමාගමේ සේවකයෙකු **2000** නොවැම්බර් **23** දින සිට **2015** ජූලි **10** දින දක්වා අමාත්‍යවරයෙකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය වෙනුවෙන් අවශ්‍ය අවස්ථා වලදී මුදාහැර තිබූ අතර එම කාලය වෙනුවෙන් එකතුව රු.**1,907,263**ක වැටුප් හා දීමනා සළුසල ආයතනයෙන් ගෙවා තිබුණි.

**4.5** කාර්ය මණ්ඩල පරිපාලනය

---

**2009** මාර්තු **31** දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන් **08** ක්ද, තෘතියික මට්ටමේ නිළධාරීන් **139** ක්ද, ද්විතියික මට්ටමේ නිළධාරීන් **101** ක්ද සේවයේ යොදවා තිබුණි. නමුත් ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබුණු අතර, බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටි සකස් කර අනුමත කරවාගෙනද නොතිබුණි.

**5.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

**5.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

**2003** ජුනි **02** දිනැති අංක පීඊඩී /**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **6.5.1** වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින **60**ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව වුවද **2008/2009** වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුනේ **2016** අප්‍රේල් **12** දිනදීය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයෙදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණයන් |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් | (i) වත්කම් හඳුනා ගෙන ලේඛන ගත කර නොතිබූ අතර, වත්කම් හඳුනා ගත හැකි පරිදි අංකනය කර නොතිබුණි. |
| | (ii) භෞතිකව තොග සමීක්ෂණය කර නොතිබුණි. |
| | (iii) ස්ථාවර වත්කම් විකිණීම් ලාභය නිසිපරිදි ගිණුම් ගත කර නොතිබුණි. |
| (ආ) ණයගැතියෝ හා ණය හිමියෝ | දීර්ඝ කාලීනව පැවත එන ණයගැති හා ණය හිමි ශේෂයන් සනාථකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) මූල්‍ය පාලනය | (i) ගෙවීම් වවුචර් පිළියෙල කර නොතිබූ අවස්ථා පැවතීම |
| | (ii) වියදම්, වත්කම් හා වගකීම්වලට අදාල උප ලේඛන ප්‍රමාණවත් ලෙස පවත්වා නොතිබීම. |
| (ඇ) ගොඩනැගිලි බදු ගැනීම හා බදු දීම | (i) විධිමත් බදු ලේඛන පවත්වා නොගැනීම. |
| | (ii) බදු දීමේදී තරඟකාරී පදනම මත බදු මුදල් තීරණය කර නොතිබීම |